**මීරිගම ප්‍රාදේශීය සභාව - 2022**

**--------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. තත්ත්වාගණනය කළ මතය

මීරිගම ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මීරිගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතා අනුව මෙම වාර්තාවේ 1.6 ඡේදයේ 1.6.1 නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ 3 ත් 10 ත් අතර කාලයකදී වැඩ අවසන් කරන ලද නමුත්, මුදල් ප්‍රතිපූර්ණය නොවූ එකතු වටිනාකම රු.8,355,598 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල කර්මාන්ත ණයගැතියෝ සහ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කර තිබුණද, එම වටිනාකම ණය හිමි සහ දේපළ, පිරියත හා උපකරණ ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ දී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.3,719,801 ක් වූ ගිණුම් ශේෂ 02 ක් යටතේ කර්මාන්ත ණයගැති ලේඛන සහ තැන්පත් ලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | 2023 වර්ෂයේ දී නිවැරදි කරන බව. | ලේඛන නිවැරදිව සකස් කළ යුතුය. |

## 1.7. අනුකූල නොවීම්

### 1.7.1. නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| | නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1946 අංක 30 දරන බදු හා තක්සේරුකරන පනතේ වගන්ති අංක 20 | 2009 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන ප්‍රවර්තන වර්ෂයේ වරිපනම් අයකර තිබුණි. | වරිපනම් තක්සේරු කටයුතු සිදු කරමින් පවතින බව. | වසර 05 කට වරක් වරිපනම් බදු තක්සේරු කර නව වරිපනම් රේට මත බදු අයකළ යුතුයි. |
| (ආ ) | මුදල් රෙගුලාසි 371 | සභාවේ 1991 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාලයක සිට නොපියවූ අත්තිකාරම් 98 ක ශේෂය රු.6,184,773 ක් සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. | ස්වාධීන පුද්ගලයෙකුගෙන් සමන්විත කමිටුවකට අනුමැතිය ඉල්ලා ඇත. ඒ අනුව ශේෂ නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අත්තිකාරම් පියවාගත යුතුයි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | මුදල් රෙගුලාසි 571 | වසර 2 ඉක්මවූ රු.1,149,362 ක තැන්පතු නියාදනය කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව නිරවුල් කිරීමට කටයුතු කරන බව. | තැන්පතු නියාදනය කල යුතුයි. |
| (ඇ) | 1980/46 හා 1980 දෙසැම්බර් 1 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 7 වන ඡේදය | අතුරු බදු ලබාදී තිබූ කඩ කාමර 4 ක් සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. | චක්‍රලේඛය පරිදි කටයුතු කිරීමට උපදෙස් ලබාදී ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.62,390,419 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.7,961,437 ක් විය.

### 2.2. ආදායම් පරිපාලනය

#### 2.2.1. ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 14,817,700 | 12,178,416 | 13,073,421 | 7,327,151 | 14,258,400 | 15,124,445 | 14,108,572 | 8,445,457 |
| (ii) | කුලී | 38,066,600 | 29,586,530 | 33,614,763 | 5,061,651 | 37,069,800 | 28,297,352 | 23,936,718 | 9,116,434 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,150,000 | 1,640,045 | 1,640,045 | 59,725 | 1,900,000 | 1,277,761 | 1,277,561 | 59,725 |
| (iv) | වෙනත් ආදායම් | 205,557,000 | 251,372,651 | 240,124,295 | 10,308,076 | 217,663,500 | 160,942,089 | 140,810,792 | 20,128,392 |
| | | 260,591,300 | 294,777,642 | 288,452,524 | 22,756,603 | 270,891,700 | 205,641,647 | 180,133,643 | 37,750,008 |

### 2.2.2. ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු.7,316,390 ක් වූ හිඟ වරිපනම් ශේෂය තුල හිඟව පැවති කාලය වසර 10 ට වැඩි ශේෂය රු.3,362,244 ක්ද, වසර 5 ත් 10 ත් අතර ශේෂය රු.1,163,261 ක්ද, වසර 3 ත් 5 ත් අතර ශේෂය රු.863,888 ක්ද විය. | ශේෂයෙන් රු.442,882 අයකිරීමට හැකි වූ බව. | පනතේ විධිවිධාන අනුව හිඟහිටි වරිපනම් බදු අය කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට කාල විශ්ලේෂණය අනුව ලැබිය යුතු වෙළඳ ස්ථාන කුලී ශේෂය රු.3,908,150 ක් වූ අතර, එයින් රු.324,800 ක් වසර 03 ත් 05 ත් අතරද, රු.67,600 ක් වසර 05 ත් 10 ත් අතරද ද විය. | කඩ හිමියන් දැනුවත් කර අයකිරීමටත්, නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටත් උපදෙස් ලබාදී ඇති බව. | ගිවිසුම් අනුව කුලී අයකර ගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අරම්භක දිනට රු.44,330 ක් වූ කර්මාන්ත බදුවලින් කිසිදු මුදලක් අයකරගෙන නොතිබුණි. | හිඟ මුදල කපා හැරීම සඳහා අනුමැතියට යොමුකර ඇති බව. | හිඟහිටි කර්මාන්ත බදු අයකළ යුතුය. |
| (ඈ) | 2019 තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබාදුන් තක්සේරුව අනුව කඩ කාමර 28 ක සහ ටෙන්ඩර් මගින් ලබාදුන් කඩ කාමර 5 ක වටිනාකම රු.46,366,800 ක් වූ පෙර මුදල් අයකරගෙන නොතිබුණි. | කඩ හිමියන් කැඳවා සාකච්ඡා කර අයකරන බව. | පෙර මුදල් ශේෂ අය කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් වන විට මහජන පැමිණිලි, මාර්ග සම්බන්ධ 58 ක්ද, අනවසර ඉදිකිරීම් සම්බන්ධ 37 ක්ද, අනතුරුදායක ගස් සම්බන්ධයෙන් 125 ක්ද, ලෙස 357 ක් ලැබී තිබුණු අතර ඉන් පැමිණිලි 185 ක් විසඳා නොතිබුණි. | ඉතිරි පැමිණිලි නොපමාව විසඳීමට කටයුතු කරන බව. | පනතේ හා අතුරු ව්‍යවස්ථාවල බලතල අනුව මහජන පැමිණිලි විසඳිය යුතුය. |

## 3.2. කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතුව ඇති ප්‍රමාණය අක්කර 2 රූඩ් 3 ක් වූ ඉඩම් 16 ක් හා ප්‍රමාණය නිශ්චිතව හඳුනාගත නොහැකි ඉඩම් 6 ක් වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුමේදී නිවැරදි කරන බව. | වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කල යුතුය. |

## 3.3. මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කඩ කාමර 341 න් 206 ක් සමග ගිවිසුම් ගතවී නොතිබුණු අතර, බදු ගිවිසුම් බොහොමයක් වර්ෂ 20 කටත් පෙර අත්සන් කළ ඒවා විය. | නව තක්සේරුව ලැබුන පසු කඩ සඳහා බදු ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කරන බව. | බදු ගිවිසුම්ගත විය යුතුය. |
| (ආ) | ඔප්පු අංක 11565 දරන, ප්‍රමාණය රූඩ් 03 පර්චස් 12 ක් සහ වටිනාකම රු.13,200,000 ක්වූ ඉඩම සභාවට පවරාගෙන නොතිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමේදී පිළියෙල කරන බව. | ඉඩම පවරාගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසන් දිනට කර්මාන්ත ණයගැති ශේෂය රු.24,477,204 ක් විය. | කර්මාන්ත ණයගැති ශේෂයෙන් මුදලක් කපා හැරීම සදහාද, ඉදිරියට ගෙන යායුතු මුදල අයකර ගැනීමටද කටයුතු කරන බව. | ණයගැති ශේෂ නිරවුල් කරගත යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසන් දිනට කර්මාන්ත ණයහිමි ශේෂය රු.35,179,224 ක් විය. | මුදලක් කපා හැරීම සදහාද, ඉදිරියට ගෙනයායුතු මුදල ගෙවීමටද කටයුතු කරන බව. | ණයහිමි ශේෂ නිරවුල් කල යුතුය |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ සේවක ණය අත්තිකාරම් ගිණුම අනුව, වාර්ෂික අයවැය මගින් බලය දුන් ලැබීම් අවම සීමාව රු.12,000,000 ක් වුවත්, වර්ෂය තුල අයකරගත් වටිනාකම රු.8,838,866 ක් වී තිබුණි. | වෙනම අත්තිකාරම් ගිණුමක් පවත්වාගෙන යන බව | ලැබීම් අවම සීමාව ළඟා කර ගත යුතුය. |

## 3.4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මියගිය සහ සේවය අතහැර ගිය නිලධාරින් දෙදෙනෙකුගේ රු.225,761 ක සේවක ණය අය වීම් හිගහිටව පැවතුණි, | විශ්‍රාම වැටුප් ගෙවීම නවත්වා ඇත. සභාවට අයවිය යුතු මුදල අයකර ලබා දෙන ලෙස මීරිගම ප්‍රාදේශීය ලේකම් වරයාටද, විශ්‍රාම වැටුප් අධ්‍යකෂ වරයාටද ලිඛිතව දන්වා ඇති බව. | සේවක ණය අය කල යුතුය. |